සුපිළිපන් දේශයක් කරා

INTEGRITY
සුපිළිපන්නභාවය

TRANSPARENCY
විනිවිදභාවය

JUSTICE
යුක්තිය

ACCOUNTABILITY
වගවීම

යුද්ධ හමුදා අභ්‍යන්තර කටයුතු ඒකකය

**Sri Lanka Army Internal Affairs Unit**

# ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආචාරධර්ම සංග්‍රහය

**‘සෑම නිලධාරියෙකුටම සහ සෙබළෙකුටම මඟ පෙන්වීමක්’**

**"වෘත්තීයභාවය, විශ්වසනීයත්වය සහ ගෞරවය තුළින් විජයග්‍රාහී යුද්ධ හමුදාවක්"**

**යුද්ධ හමුදා අභ්‍යන්තර කටයුතු ඒකකය**

**අන්තර්ගතය**

පෙරවදන ........................................................................................................................3

අභ්‍යන්තර කටයුතු ඒකක ප්‍රධානිගේ පණිවිඩය..........................................................................4

1. මෙම ආචාරධර්ම සංග්‍රහය අනුගමනය කළ යුත්තේ කවුද? ...................................................5

2. අපගේ මූලික හර පද්ධතිය (වටිනාකම්) ...........................................................................5

3. ඔබගේ වෘත්තීය............................................................................................................6

4. ආචාර ධර්ම සහ සුපිළිපන්නභාවය.....................................................................................7

5. මූල්‍යමය විනිවිදභාවය ......................................................................................................8

6. ත්‍යාග රීතීන් ..................................................................................................................8

7. මානව හිමිකම් සහ මානුෂීය හැසිරීම් ...............................................................................9

8. තොරතුරු ආරක්ෂාව සහ සන්නිවේදනය.............................................................................10

9. ප්‍රසම්පාදනය සහ මූල්‍ය කළමනාකරණය ...........................................................................10

10. උල්ලංඝනයන් (Violations) වාර්තා කිරීම සහ රහස් හෙළි කරන්නන්ගේ (Whistleblower) ආරක්ෂාව ...........................................................................................................................11

11. වගවීම සහ බලාත්මක කිරීම.........................................................................................12

12. සාම සාධක මෙහෙයුම් සහ ජාත්‍යන්තර මෙහෙයුම් ............................................................12

13. පුහුණුව සහ අඛණ්ඩ වර්ධනය. .......................................................................................13

සමාප්තිය .......................................................................................................................14

# පෙරවදන



යුද්ධ හමුදාධිපති

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ඉතිහාසය ලියැවී ඇත්තේ විනය, කැපවීම සහ උත්තරීතර ආචාරධර්ම මතය. එම ඉතිහාසයේ වර්තමාන උරුමකරුවන් වන ඔබ සැමගේ ක්‍රියාකලාපය හමුදාවේ ජීව ගුණය තීරණය කරනු ලබයි. මෙම ආචාරධර්ම සංග්‍රහය ඔබගේ ස්පීරසාර මඟපෙන්වන්නා විය යුතුය. වෘත්තීය සේවයේදී ඔබ මුහුණ දෙන අභියෝග හමුවේ නොසැලී සිටීමටත්, ආයතනයේත් ජාතියේත් අභිමානය ආරක්ෂා කිරීමටත් මෙමඟින් මඟ පෙන්වනු ඇත. ජනතාව අප කෙරෙහි තබා ඇති විශ්වාසය අප සතු උතුම්ම වත්කමයි. පූර්වගාමී විරුවන්ගේ මඟ ගනිමින්, නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කැපවූ අපරාජිත යුද්ධ හමුදාවක් ලෙස හෙට දවස සුරක්ෂිත කිරීමට එක්වන ලෙස මම ඔබ සැමගෙන් ඉල්ලා සිටිමි.

**ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී**
**ලූතිනන් ජෙනරල්**

# අභ්‍යන්තර කටයුතු ඒකක ප්‍රධානිගේ පණිවිඩය



වෘත්තීයභාවය, විශ්වසනීයත්වය සහ ගෞරවය තුළින් විජයග්‍රාහී යුද්ධ හමුදාවක් බිහිකිරීමේ අරමුණින්, සෑම නිලධාරියෙකුටම සහ සෙබළෙකුටම මඟ පෙන්වීමක් ලෙස මෙම ආචාරධර්ම සංග්‍රහය හඳුන්වා දෙනු ලැබේ. සුපිළිපන්නභාවය, විනිවිදභාවය, යුක්තිය සහ වගවීම වැනි අපගේ මූලික හර පද්ධතීන් ඔබගේ වෘත්තීය චර්යාවෙන් නිරූපණය විය යුතු අතර, ජාතික මෙහෙවර වෙනුවෙන් සදාචාර සම්පන්නව හා නෛතිකව බැඳී සිටීම ඔබගේ වගකීමකි. කිසිදු පෞද්ගලික හෝ දේශපාලන අවශ්‍යතාවන් හමුවේ තම පක්ෂපාතීත්වය වෙනස් නොකර, අල්ලස සහ දූෂණය පිටුදකිමින්, සෑම විටම දේශයට සහ හමුදාවට ගෞරවයක් වන අයුරින් ආදර්ශමත් නායකත්වයකින් යුතුව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. ජනතාව අප කෙරෙහි තබා ඇති උතුම්ම වත්කම වන විශ්වාසය සුරකිමින් , මෙම ආචාරධර්ම සංග්‍රහය ඔබගේ ස්ථිරසාර මඟපෙන්වන්නා කරගනිමින් ආයතනයේත් ජාතියේත් අභිමානය සුරැකීමට කැපවන ලෙස මම ඔබ සැමගෙන් ඉල්ලා සිටිමි.

**ඩී.කේ.එස්.කේ. දොලගේ යූඑස්පී එන්ඩීඑස් පීඑස්සී**

**මේජර් ජෙනරාල්**

**මාණ්ඩලික ප්‍රධානී සහ අභ්‍යන්තර කටයුතු ඒකකයේ ඒකක ප්‍රධානී**

# 1. මෙම ආචාරධර්ම සංග්‍රහය අනුගමනය කළ යුත්තේ කවුද?

1.1 යුද්ධ හමුදාවේ සියලුම සාමාජිකයින්:

1.1.1 සියලුම නිලධාරින් සහ සෙබළුන්.

1.1.2 යුද්ධ හමුදා කඳවුරුවල සිටින සේවයේ නියුතු සියලු සිවිල් සේවකයන්.

මෙම ආචාරධර්ම සංග්‍රහය හුදු මඟ පෙන්වීමක් පමණක් නොවන අතර, යුද්ධ හමුදා සාමාජිකයෙකු වශයෙන් ශ්‍රී ලාංකික ජාතිය වෙත ඔබගෙන් ඉටු විය යුතු මෙහෙවර මනාව හා සංවිධිතව නිශ්චය කිරීමත් ඔබගේ වගකීම හා වගවීමෙහි සීමාව සමාලෝචනය කරමින් සෑම යුද්ධ හමුදා සාමාජිකයෙකු වෙතම සිය මෙහෙවර කෙරෙහි සදාචාර සම්පන්න මෙන්ම නෛතික බැඳීමක් ඇති කිරීමත් මෙම ආචාර ධර්ම සංග්‍රහය ඉදිරිපත් කිරීමේ අරමුණ වන්නේය.

# 2. අපගේ මූලික හර පද්ධතිය (වටිනාකම්)

2.1 සෑම යුද්ධ හමුදා සාමාජිකයෙකු විසින්ම තම වටිනාකම් සිය චර්යාවෙන් හා පැවැත්මෙන් නිරූපනය කළ යුතු වේ.

2.1.1 දේශප්‍රේමය (Patriotism) - දේශයට කැප වූ ආදරය හා සේවය.

2.1.2 භක්තිය (Loyalty) - ඔබගේ ප්‍රමුඛතම පක්ෂපාතීත්වය ශ්‍රී ලංකාවට, එහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ නීත්‍යානුකූල රජයට ලබාදීම හා කිසිදු පෞද්ගලික, දේශපාලනික හෝ වෙනත් අවශ්‍යතාවන් හමුවේ ඉන් විතැන් නොවීම.

2.1.3 සුපිළිපන්නභාවය (Integrity) - ඔබ සෑම විටකම අවංක මෙන්ම අව්‍යාජ විය යුතු වේ. අයථා මාර්ගවලින් ගැටලු විසඳීමෙන් වැළකීම හා අන් අය විසින් කරනු ලබන අල්ලස හෝ දූෂණයට සම්බන්ධ ක්‍රියාවලට එරෙහි වීම.

2.1.4 ගෞරවය (Honour) - සෑම විටම යුද හමුදාවට සහ ශ්‍රී ලංකාවට ආඩම්බරයක් වන සේ හැසිරීම.

2.1.5 දැනුම (Knowledge) - වෘත්තීය විශිෂ්ටත්වය සහ අධ්‍යාපනික ඵලදායීතාව ඉහළ නැංවීම.

2.1.6 ධෛර්යය (Courage) - අන්තරායයන් හමුවේ නිර්භීතකම සහ නිවැරදි දේ කිරීමට සදාචාරාත්මක ධෛර්යය පෙන්වීම.

2.1.7 විනය (Discipline) - නීත්‍යානුකූල නියෝග නිසි පරිදි පිළිපැදීම හා සෑම විටම ස්වයං පාලනයකින් යුක්තව යුද්ධ හමුදා විනයට අනුගත වීම.

2.1.8 වීරත්වය (Valour) - සතුරා ඉදිරියේදී ඇති විශිෂ්ට නිර්භීතකම.

2.1.9 එකමුතුබව (Unity) - සහයෝගීතාව, කණ්ඩායම් හැඟීම සහ අන්‍යෝන්‍ය සහයෝගය.

2.1.10 කැපවීම (Commitment) - මෙහෙවර සහ අන්‍යෝන්‍ය අභිප්‍රේරණය.

# 3. ඔබගේ වෘත්තීය

3.1 සෑම අයෙකුම සිය භූමිකාවේ දී නායකයෙකි:

3.1.1 ආදර්ශයෙන් නායකත්වය දෙන්න - සෑම විටකම ඔබගේ හැසිරීම අනෙක් අයට මාර්ගෝපදේශයක් වන බව සිහි තබා ගන්න.

3.1.2 ඔබගේ ජනතාව ගැන සැලකිලිමත් වෙමින් ඔබගේ මෙහෙවර ඉටු කරන්න.

3.1.3 ඔබගේ සාර්ථකත්වය මුළු මහත් සමාජයේම සාර්ථකත්වය කෙරෙහි පදනම් වන බව වටහාගන්න.

3.1.4 අනෙකාගේ වෘත්තීය අභිවෘද්ධිය හා සංවර්ධනය කෙරෙහි ඇප කැප වන්න.

3.2 නියෝග අනුගමනය කිරීම:

3.2.1 නීත්‍යානුකූල සියලු නියෝග යථා පරිදි හා විධිමත්ව අනුගමනය කරන්න.

3.2.2 නියෝගයක් පැහැදිලි නොවන්නේ නම්, නිසි පැහැදිලි කිරීමක් ලබා ගන්න.

3.2.3 නීත්‍යනුකූල නොවන හෝ අයථා නියෝග අනුගමනය නොකර - ඒ පිළිබඳ වහාම වාර්තා කරන්න.

3.2.4 ඔබ ජාතික මෙහෙවරට උරදුන් එඩිතර හා බුද්ධිමත් යුද්ධ හමුදා සමාජිකයෙකු බව වචනයෙන් හා ක්‍රියාවෙන් ප්‍රකාශ කරන්න.

3.3 මෙහෙයුම් සූදානම තබාගැනීම:

3.3.1 නව යුද කුසලතා සහ තාක්ෂණික දැනුම රැස්කර ගැනීමට නිරන්තරයෙන් උත්සහ කරන්න.

3.3.2 ශාරීරික යෝග්‍යතාවය නියමිත මට්ටමින් පවත්වාගෙන යන්න.

3.3.3 මානසික ධෛර්යය සහ නිවැරදි තීරණ ගැනීමේ හැකියාවන් වර්ධනය කරන්න.

3.3.4 ඔබ භාරයේ පවත්නා මානව හා තාක්ෂණික සම්පත් මෙන්ම වගකීම් හා කාර්යයන් පිළිබඳව පූර්ණ අවබෝධයක් ලබාගන්න.

3.4 සිවිල් පුද්ගලයින් සමඟ ක්‍රියා කිරීම:

3.4.1 සිවිල් නායකත්වය සහ ප්‍රජාතාන්ත්‍රික සමාජ ව්‍යුහයට ගෞරවය දක්වන්න.

3.4.2 දේශපාලන ක්‍රියාකාරකම්වලට සම්බන්ධ නොවන්න.

3.4.3 ප්‍රාදේශීය සමාජ ක්‍රියාකාරකම් සමඟ ධනාත්මකව සම්බන්ධ වන්න.

3.4.4 මාධ්‍ය නියෝජිතයන් සමඟ ක්‍රියා කිරීමේදී වෘත්තීය ගෞරවය ආරක්ෂා වන පරිදි නීත්‍යානුකූල වපසරියතුළ ක්‍රියාත්මක වන්න.

# 4. ආචාර ධර්ම සහ සුපිළිපන්නභාවය

## 4.1 දූෂණය පිටු දැකීම සඳහා සෑම විටම සක්‍රියව එරෙහි වන්න:

### 4.1.1 කිසි විටෙක මේවා නොකරන්න:

4.1.1.1 අල්ලස් ගැනීම හෝ දීම.

4.1.1.2 පෞද්ගලික වාසි සඳහා ඔබගේ තනතුර භාවිත කිරීම.

4.1.1.3 යුද්ධ හමුදා දේපළ සොරකම් කිරීම හෝ අනිසි ලෙස භාවිත කිරීම.

4.1.1.4 මිතුරන්ට හෝ පවුලේ අයට අයුතු වාසි ලබාගැනීමට කටයුතු සැලසීම.

4.1.1.5 පෞද්ගලික ප්‍රතිලාභ සඳහා අසත්‍ය ප්‍රකාශ කිරීම හෝ වංචාවක් කිරීම.

### 4.1.2 සෑම විට ම මේවා කරන්න:

4.1.2.1 සැක සහිත දූෂණ ක්‍රියා වහාම වාර්තා කරන්න.

4.1.2.2 නීති විරෝධී ලෙස ආදායම් ඉපැයීමෙන් වළකින්න.

4.1.2.3 මූල්‍ය වාර්තා පැහැදිලිව හා නිවැරදිව පවත්වාගෙන යන්න.

4.1.2.4 තුටු පඬුරු පිළිගැනීමේ සහ පිරිනැමීමේ නීති හා සීමා අනුගමනය කරන්න.

## 4.2 බැඳියාවන් අතර ගැටුම් වළක්වා ගන්න:

4.2.1 ඔබගේ රාජකාරිවලට පටහැනි ආයෝජන හෝ මූල්‍යමය බැඳීම් සිදු නොකරන්න.

4.2.2 ද්විතීය ආදායම් ඉපයීමක් සිදු කරන්නේ නම් ඒ සඳහා නිසි අනුමැතිය ලබා ගන්න.

4.2.3 ඔබගේ රාජකාරි සමග ගැටීමක් ඇතිවිය හැකි යම් පෞද්ගලික බැඳියාවක් ඇත්නම් එය නිසි ලෙස ප්‍රකාශ කරන්න.

4.2.4 ඔබගේ ස්වාධීනත්වයට බලපෑම් කළ හැකි පෞද්ගලික සම්බන්ධතා පිටුදකින්න.

4.2.5 පෞද්ගලික වාසිය සඳහා කිසිවිටෙක නිල තොරතුරු භාවිත නොකරන්න.

## 4.3 රාජකාරියේ දී සහ ඉන් බැහැර දී ප්‍රමිතීන් පවත්වා ගන්න:

4.3.1 යුද හමුදා නිල ඇඳුමට ගැළපෙන වෘත්තීයමය පෙනුමක් සහ හැසිරීමක් පවත්වා ගන්න.

4.3.2 සෑම කෙනෙකුටම ආචාරශීලීව සලකන්න.

4.3.3 යුද්ධ හමුදා සම්පත් වගකීමෙන් භාවිත කරන්න.

4.3.4 ඔබගේ පෞද්ගලික ජීවිතයේ දී නීතිගරුක වන්න.

4.3.5 සමාජ මාධ්‍ය භාවිතයේ දී වගකීමෙන් කටයුතු කරන්න.

4.3.6 ඔබ ජීවත්වන සමාජයට ධනාත්මක දායකත්වයක් ලබා දෙන්න.

# 5. මූල්‍යමය විනිවිදභාවය

5.1 වත්කම් බැරකම් ප්‍රකාශ කළ යුත්තේ කවුද:

5.1.1 සියලුම නිලධාරීන් (Officers).

5.1.2 ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන් (බලලත් නිලධාරි II සහ ඉහළ තනතුරු - යුද්ධ හමුදාධිපති නිගමනය කරන ඕනෑම අවස්ථාවක හෝ රජයේ කාර්යාංශ ඉල්ලුම් කරන ඕනෑම අවස්ථාවක දී).

5.1.3 මූල්‍ය, ගනුදෙනු, මිලදී ගැනීම්, හෝ බුද්ධි සේවා තනතුරු වල සේවයේ නියුතු සියලුම අය (යුද්ධ හමුදාධිපති නිගමනය කරන ඕනෑම අවස්ථාවක හෝ රජයේ කාර්යාංශ ඉල්ලුම් කරන ඕනෑ ම අවස්ථාවක දී).

5.2 ප්‍රකාශ කිරීමට අදාළ අවස්ථා සහ දිනයන්:

5.2.1 වාර්ෂිකව, මාර්තු 31 දිනට ඇති වත්කම් සහ බැරකම් ජූනි 30 ට පෙර ප්‍රකාශ කිරීම.

5.2.2 පත්වීමෙන් දින 30ක් ඇතුළත අදාල නෛතික කාල සීමාව තුල.

5.2.3 ඔබ විශ්‍රාම ගන්නා විට හෝ ඉල්ලා අස්වන විට අදාල නෛතික කාල සීමාව තුල.

5.2.4 ඔබේ වත්කම් සැලකිය යුතු ලෙස වෙනස් වන සෑම විටම අදාල නෛතික කාල සීමාව තුල.

5.3 ප්‍රකාශයට ඇතුළත් කළ යුතු දේ:

5.3.1 දේපල, බැංකු ගිණුම්, ආයෝජන.

5.3.2 ව්‍යාපාරික වාසි හෝ වටිනා භාණ්ඩ.

5.3.3 ණය, පවුලේ දේපල සහ අදාළ සම්බන්ධතාවයන්.

# 6. ත්‍යාග රීතීන්

6.1 ත්‍යාග සහ සත්කාරකත්වයට අදාළ ආචාරධර්මීය ප්‍රමිතීන්:

6.1.1 ගනුදෙනුකරුවන්ගෙන් හෝ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුදල්, වටිනා භාණ්ඩ හෝ තෑගි කිසිවිටෙකත් නොපිළිගන්න.

6.1.2 ගනුදෙනුකරුවන්ගෙන් හෝ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලැබෙන තෑගි නිසි පරිදි ආයතනයට භාරදීමට ක්‍රියා කරන්න.

6.1.3 සියලු තෑගි ලියාපදිංචි කිරීම සඳහා “තෑගි ලේඛනයක් (Gift Register)” නඩත්තු කරන්න.

# 7. මානව හිමිකම් සහ මානුෂීය හැසිරීම්

7.1 සැම විටම මානව අභිමානයට ගරු කරන්න:

7.1.1 මානව හිමිකම් සැමට පොදු වන අතර, ඒ සඳහා ව්‍යතිරේඛ නොපවතී.

7.1.2 ජාතික අවශ්‍යතාවයන් මත මානව හිමිකම් සීමා කළයුතු වන්නේ නම් ඒ සඳහා අවශ්‍ය අවම බලය පමණක් භාවිත කරන්න.

7.1.3 ඔබගේ සද්භාවී ක්‍රියාවකින් මානව හිමිකම් උල්ලංඝනය වුවහොත් එහි වගකීම ගන්න. (සද්භාවී ක්‍රියා සඳහා නීතියේ රැකවරණය ඔබ වෙත පවත්නා බව සිහියට ගන්න.)

7.1.4 මිනිසුන්ට ඔවුන්ගේ පසුබිම නොසලකා සමානව සලකන්න.

7.2 පුරවැසියන් ආරක්ෂා කරන්න:

7.2.1 සියලුම පුරවැසියන් සමඟ ඔබ ගෞරවයෙන් හා ආචාරශීලීව හැසිරෙන්න.

7.2.2 ඔවුන්ගේ දේපල හා ජීවිත ආරක්ෂා කරන්න.

7.2.3 ඔවුන්ගේ දෛනික ජීවිතයට බාධාවක් ඇති නොවන පරිදි කටයුතු කරන්න.

7.2.4 ප්‍රාදේශීය සිරිත් විරිත් සහ සම්ප්‍රදායන්ට ගරු කරන්න.

7.3 රැඳවියන්ට මානුෂීයව සලකන්න:

7.3.1 නිසි පරිදි අත්අඩංගුවට ගැනීමේ ක්‍රියා පටිපාටින් අනුගමනය කරන්න.

7.3.2 තමා භාරයේ සිටින රැඳවියන් වෙත ප්‍රමාණවත් ආහාර, ජලය සහ වෛද්‍ය ප්‍රතිකාර ලබා දෙන්න.

7.3.3 ඔවුන්ගේ නීතිමය අයිතිවාසිකම් ඔවුන්ට දැනුම් දෙන්න.

7.3.4 අත්අඩංගුවේ සිටින පුද්ගලයන් පිළිබඳ නිසි ලේඛන පවත්වා ගන්න.

7.3.5 කිසිවිටෙක වධහිංසා, ලිංගික ප්‍රචණ්ඩත්වය හෝ අවමන් සහගත හැසිරීම්හි නිරත නොවන්න.

7.4 දේශපාලන පක්ෂපාතී භාවයෙන් ඉවත්වන්න:

7.4.1 මැතිවරණ ව්‍යාපාර හෝ දේශපාලන ක්‍රියාකාරකම් වල නිරත නොවන්න.

7.4.2 සියලුම දේශපාලන පක්ෂවලට සමානව සලකන්න.

7.4.3 ආරක්ෂක හෝ රාජ්‍ය සම්පත් දේශපාලන කටයුතු සඳහා භාවිතා නොකරන්න.

7.4.4 පුද්ගලික දේශපාලන මතිමතාන්තර පසෙකලා ජාතික පුනර්ජීවනය උදෙසා ඇපකැප වන්න.

# 8. තොරතුරු ආරක්ෂාව සහ සන්නිවේදනය

8.1 රහසිගත තොරතුරු ආරක්ෂා කරන්න:

8.1.1 රාජකාරියේ යෙදී සිටින විටද එසේ නොමැති විටද, සෑම විටම තොරතුරු ආරක්ෂාව සහතික කරන්න.

8.1.2 රහසිගත ලේඛන හා දත්ත නිසි ලෙස ආරක්ෂිතව ගබඩා කරන්න.

8.1.3 රහසිගත හෝ සංවේදී තොරතුරු හුවමාරු කිරීමේදී සහ පරිශීලනයේදී ආරක්ෂිත ක්‍රම වලට අනුගත වන්න.

8.1.4 රහසිගත හෝ සංවේදී තොරතුරු සම්බන්ධයෙන් ඇති ඕනෑම අවදානම් සහ සැලකිලිමත් විය යුතු ක්ෂේත්‍ර දැන ගත් විගස අදාළ නිලධාරීන්ට වාර්තා කරන්න.

8.2 සමාජ මාධ්‍ය භාවිතය සඳහා මාර්ගෝපදේශ:

8.2.1 පෞද්ගලික  අදහස් පළ කරන විට එය පෞද්ගලික අදහසක් බව පැහැදිලි කරන්න.

8.2.2 මෙහෙයුම් හෝ සංවේදී තොරතුරු කිසි විටෙකත් බෙදා නොහරින්න.

8.2.3 සමාජ මාධ්‍ය තුළ වෘත්තීය ගෞරවය සහ සීමාව රැක ගන්න (නිල ඇඳුම සහිත ඡායාරූප පළ කිරීමෙන් වළකින්න).

8.2.4 ද්වේෂ සහගත ප්‍රකාශ සහ අපහාසාත්මක හෝ තර්ජනාත්මක ප්‍රකාශවලින් වැළකෙන්න.

8.3 මාධ්‍ය සමඟ සම්බන්ධතා:

8.3.1 මාධ්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට අවසර ලැබූ නිල ප්‍රකාශකයන් පමණක් එම භූමිකාව ඉටු කළ යුතු ය.

8.3.2 ජනමාධ්‍ය වෙත සත්‍ය සහ සනාථ කර ඇති තොරතුරු පමණක් ලබා දෙන්න.

8.3.3 මාධ්‍ය විමසීම් සඳහා ආචාරසම්පන්න හා කඩිනම් ප්‍රතිචාර සපයන්න.

8.3.4 විනිවිදභාවය සහ ආරක්ෂාව අතර, සුදුසු පරිදි සමතුලිතතාව පවත්වාගෙන යන්න.

# 9. ප්‍රසම්පාදනය සහ මූල්‍ය කළමනාකරණය

9.1 සාධාරණ ප්‍රසම්පාදන කාර්ය පටිපාටියක් අනුගමනය කරන්න:

9.1.1 සියලු මිල දී ගැනීම් ක්‍රියාවලි සාධාරණත්වය, විනිවිදභාවය සහ තරඟකාරීත්වය මත පදනම්ව ක්‍රියාත්මක කළ යුතු ය.

9.1.2 මිල දී ගැනීම්වල දී පෞද්ගලික වාසි හෝ බැඳියාවන්ට ඉඩ නොදෙන්න.

9.1.3 සැපයුම්කරුවන්ගේ සහ කොන්ත්‍රාත්කරුවන්ගේ ශක්‍යතාව, විශ්වාසනීයත්වය, සහ

නීතිගරුකභාවය සනාථ කරගන්න.

9.1.4 සියලු ගනුදෙනු හා ගිවිසුම්, නිවැරදිව හා නිසියාකාරයෙන් ලේඛනගත කරන්න.

9.2 කිසි විටෙකත් මේ දේ නොකරන්න:

9.2.1 විශේෂිත සැපයුම්කරුවන්ට හෝ කොන්ත්‍රාත්කරුවන්ට හෝ වෙනත් පාර්ශවයකට නීත්‍යානුකූල නොවන වාසි ලබා දීම.

9.2.2 කොමිස්, සන්තෝෂම්, හෝ අන් කිසිදු පෞද්ගලික වාසියක් ලබාගැනීම.

9.2.3 නෛතික අධීක්ෂණයන් මඟ හැරීම සඳහා කොන්ත්‍රාත්තු ක්‍රියාපටිපාටිය වෙනස් කිරීම.

9.2.4 සාවද්‍ය ලෙස තොරතුරු වෙනස් කිරීම, සාවද්‍ය වාර්තා ඉදිරිපත් කිරීම හා අත්‍යාවශ්‍ය නොවන ප්‍රමිතීන් ඉදිරිපත් කිරීම.

9.3 මූල්‍ය කළමනාකරණයේ වගකීම්:

9.3.1 සියලු මිලදී ගැනීම් සහ වියදම් "මුදලට සරිලන වටිනාකම (Value for Money)" මත පදනම්ව සිදු කරන්න.

9.3.2 අනුමත මූල්‍ය සීමාවන් ඇතුළත පමණක් වියදම් කරන්න.

9.3.3 සියලු වියදම් සඳහා නිසි අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව පමණක් ක්‍රියාත්මක වන්න.

9.3.4 සියලුම මූල්‍ය ගනුදෙනු සඳහා සවිස්තරාත්මක ලේඛන නඩත්තු කරන්න.

9.3.5 විගණන සහ පරීක්ෂණ කටයුතු සඳහා සම්පූර්ණ සහයෝගය ලබා දෙන්න.

# 10. උල්ලංඝනයන් (Violations) වාර්තා කිරීම සහ රහස් හෙළි කරන්නන්ගේ (Whistleblower) ආරක්ෂාව

10.1 පහත සඳහන් අවස්ථාවන්හි දී ඔබ විසින් අදාල ස්ථානයන් වෙත වාර්තා කළ යුතුය:

10.1.1 මෙම සංග්‍රහය උල්ලංඝනය කිරීම්.

10.1.2 අපරාධ ක්‍රියාකාරකම්.

10.1.3 අල්ලස, දූෂණය හෝ නාස්තිය.

10.1.4 අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ තොරතුරු.

10.1.5 මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්.

10.1.6 ආරක්ෂාව පිළිබඳ අවදානම් හෝ ආරක්ෂක නිර්ණායක උල්ලංඝනයන්.

10.2 වාර්තා කරන්නේ කෙසේද?:

10.2.1 ඔබගේ ඉහළ ජ්‍යෙෂ්ඨ නිලධාරියා හෝ අණ දෙන නිලධාරියා හෝ ආයතන ප්‍රධානියා වෙත.

10.2.2 අභ්‍යන්තර කටයුතු ඒකකය (දූෂණ විරෝධි ක්‍රියා හෝ අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ තොරතුරු).

10.3 ඔබ සද්භාවී චේතනාවකින් වාර්තා කරනවිට නීතියේ රැකවරණය ඔබ වෙත හිමි වේ:

10.3.1 ඔබ වෙත ප්‍රතිප්‍රහාර එල්ල නොවේ.

10.3.2 නෛතික ක්‍රියා පටිපාටිය තුළ ඔබගේ අනන්‍යතාව ආරක්‍ෂා කර ඇත.

10.3.3 නෛතික රැකවරණය හා සුහදශීලී සහයෝගය හිමි වේ.

10.3.4 ඔබගේ වෘත්තියට අහිතකර බලපෑමක් ඇති නොවේ.

# 11. වගවීම සහ බලාත්මක කිරීම

11.1 සියලු අණ දෙන්නන් පහත ක්‍රියාවන් සඳහා වගකිව යුතුය:

11.1.1 නිසි නායකත්වය තුළින් අනිසි හැසිරීම් හා උල්ලංඝනයන් වළක්වන්න.

11.1.2 වැරදි හා නොමනා හැසිරීම් නිරීක්ෂණය කරන්න.

11.1.3 සෑම පුද්ගල හැසිරීමක් හා සිද්ධියක්ම නිසි ලෙස විමර්ශනය කරන්න.

11.1.4 විනය විරෝධී ක්‍රියා කරන්නන්ට එරෙහිව සුදුසු විනය ක්‍රියාමාර්ග ගන්න.

11.1.5 බරපතළ උල්ලංඝනයන් ඉහළ මූලස්ථාන වෙත වාර්තා කරන්න.

11.2 ප්‍රතිවිපාක සමානුපාතික වේ:

11.2.1 පරිපාලන ක්‍රියාමාර්ග (උපදෙස් දීම, අවවාද කිරීම, පුහුණුව).

11.2.2 යුද්ධ හමුදා පනත යටතේ හමුදා විනය.

11.2.3 සිවිල් නීතිය යටතේ අපරාධ නඩු පැවරීම.

11.2.4 පාඩු මූල්‍ය වශයෙන් අය කර ගැනීම.

සලකා බලන සාධක: උල්ලංඝනය කිරීමේ බරපතළකම, ඔබේ තරාතිරම සහ අත්දැකීම්, පෙර වාර්තා සහ තත්වයන්.

# 12. සාම සාධක මෙහෙයුම් සහ ජාත්‍යන්තර මෙහෙයුම්

12.1 එක්සත් ජාතීන්ගේ ප්‍රමිතීන් අදාළ වේ (UN Standards Apply):

12.1.1 ඔබ වෙත පවරා ඇති බලය ක්‍රියාත්මක කිරීමේ දී මධ්‍යස්ථව සිටින්න.

12.1.2 සියලුම පුද්ගලයින්ගේ මූලික අයිතිවාසිකම්වලට ගරුකරන්න.

12.1.3 දේශීය සංස්කෘතීන්ට සංවේදී වන්න.

12.1.4 ඉහළම වෘත්තීය ප්‍රමිතීන් පවත්වා ගන්න.

12.2 අසංවිධිත ලිංගික චර්යා පිටුදැකීම (Zero Tolerance):

12.2.1 වයස අවුරුදු 18කට අඩු කිසිදු අයෙකු සමඟ ලිංගික ක්‍රියාකාරකම් සිදු නොකිරීම.

12.2.2 ලිංගික සම්බන්ධතා සඳහා මුදල්, භාණ්ඩ හෝ සේවා හුවමාරු නොකිරීම.

12.2.3 ඔබ වෙතින් ආධාර උපකාර ලබා ගන්නා අය සමඟ ලිංගික සම්බන්ධතා නොපැවැත්වීම.

12.2.4 කිසිදු ආකාරයක ලිංගික හිංසනයන් සිදු නොකිරීම.

12.2.5 ලිංගික චෝදනාවන්ට ලක් වූවන් සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක වීම.

12.3 යුද්ධ හමුදා ප්‍රමිතීන් ලොව පුරා අදාළ වේ (Army Standards Apply Worldwide):

12.3.1 ඔබ සේවය කරන සෑම ස්ථානයක් සඳහාම මෙම සංග්‍රහය අදාළ වේ.

12.3.2 සත්කාරක රටෙහි නීතිවලට ගරු කරන්න.

12.3.3 ජාත්‍යන්තර මානුෂ්‍යවාදී නීතිය අනුගමනය කරන්න.

12.3.4 රාජ්‍යතාන්ත්‍රික ප්‍රතිවිපාක කෙරෙහි සැලකිලිමත් වන්න.

# 13. පුහුණුව සහ අඛණ්ඩ වර්ධනය.

13.1 සෑම කෙනෙකුම පුහුණුවන්නෙකු වේ:

13.1.1 සියලු නවකයන් සඳහා මූලික පුහුණුව ලබාදිය යුතුය.

13.1.2 වාර්ෂික ප්‍රත්‍යාවර්තන පුහුණුවක් සැපයිය යුතුය.

13.1.3 ඔබගේ කාර්යභාරය අනුව විශේෂිත පුහුණුව ලබා ගත යුතුය.

13.1.4 අණ දෙන්නන් සඳහා වැඩි දියුණු කළ පුහුණුව ලබා ගත යුතුය.

13.2 අපි නිරන්තරයෙන් වර්ධනය වන්නෙමු:

13.2.1 වාර්ෂික කාර්යක්ෂමතා තක්සේරු කිරීම්.

13.2.2 කාර්ය මණ්ඩලය සහ සිවිල් වැසියන්ගෙන් ප්‍රතිපෝෂණ වීම.

13.2.3 නව නීති මත පදනම් වූ යාවත්කාලීන කිරීම්.

13.2.4 ජාත්‍යන්තර උසස් ප්‍රමිතීන් සමඟ පෙළගැස්වීම.

අපගේ ප්‍රමිතීන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා විනය ප්‍රවණතා නිරීක්ෂණය කිරීම, සමීක්ෂණ පැවැත්වීම සහ අධීක්ෂණ ආයතනවලින් අදහස් යෝජනා රැස් කිරීම සිදු කෙරේ.

# සමාප්තිය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ශක්තිය සහ ජීවය රඳා පවතින්නේ යුද්ධ හමුදා නිල ඇඳුම අඳින සෑම පුද්ගලයෙකුම චරිතය හා සුපිළිපන්නභාවය තුළ ය. මෙම සංග්‍රහය ඔබගේ ස්ථිර මාර්ගෝපදේශකයා වනු ඇත - මෙය ඔබගේ මූලික වටිනාකම් කිසි විටෙකත් අමතක නොකර, හමුදා සේවයේ අභියෝග හමුවේ ඔබේ ක්‍රියාකාරිත්වයට මඟ පෙන්වයි. ඔබ ගන්නා සෑම තීරණයක්ම, ඔබ කරන සෑම ක්‍රියාවක්ම, ඔබ ගැන පමණක් නොව, අපගේ සමස්ත ආයතනයේ ගෞරවය හා අප සේවය කරන ජාතියේ අභිමානය ද විදහා දක්වයි. ශ්‍රී ලංකාවේ ජනතාවගේ විශ්වාසය යනු අප සතු අතිශය වටිනාම සම්පතයි. මීත් පෙර දේශයට සේවය කළ යුද්ධ හමුදා විරුවන් සේම, අද දින අභියෝග ජය ගැනීමට අපිද අධිෂ්ඨාන කර ගනිමු. මෙම ආචාරධර්ම සංග්‍රහය නිරතුරුවම ආරක්‍ෂා කිරීමෙන් හා පවත්වාගෙන යෑමෙන්, අපි අපගේ අතීත ගරුත්වය රැකගනිමින් සේවය කරමින්, වර්තමානය ආරක්ෂා කරමින්, ශ්‍රී ලංකාවේ නිදහසේ සහ ප්‍රජාතන්ත්‍රවාදයේ නොසැලෙන ආරක්‍ෂකයින් ලෙස අපගේ අනාගතය සුරක්ෂිත කරන්නෙමු.

(ලේඛන තත්වය: සීමා කර ඇත / අනුවාදය 1.0 / ඊළඟ සමාලෝචනය: වසර 2කට පසු)